THE JOURNAL OF LANGUAGE AND CULTURE

Volume 1 - Issue II
December 2021

T J O L C
ISSN 2806-5395

Category: Research Article

# 19 වන සියවසේ ක්ෂණික කාව්‍ය බන්ධනයන්හි සමාජ දෘෂ්ටිය පිළිබඳව විග්‍රහයක්

පූජ්‍ය ඔලගන්වත්තේ චන්ද්‍රසිරි හිමි

**ARTICLE DETAILS**

Published Online & Printed
December 2021

***Author:***

**ආචාර්ය පූජ්‍ය ඔලගන්වත්තේ චන්ද්‍රසිරි හිමි**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
භාෂා අධ්‍යයනාංශය, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ.
*Email: chandrasirihimi@hotmail.com*

**Keywords:**
Printing Technology, Colebrook Commission, Common Poetry.

## Abstract

The Sri Lankan traditional society was subjected to a substantial transformation as it succumbed to Western invasions. Sri Lanka's surrender to the British dominance respectively following the Portuguese and Dutch invasions was a turning point of this transformation. In 1829 William Colebrook and C.H. Cameron altered the rule, economy and the education of the country. Cameron prepared what is known as the Corporate Revision Report while other reports were presented by Colebrook. The implementation of those reforms as recommended by the commission was the leading cause which directed the entire history of Sri Lanka in a new path to be characterized by a rapid change in 19$^{th}$ century. This transformation was seen in a number of sectors which are, economic, political, cultural, religious and literary. In the British era, with the expansion of the printing technology Sinhala literature saw a conspicuous change. The impact of the Western literature along with the emanation of diversity in the traditional literary tradition was seen. Special attention should be drawn to the transformation that took place in 19$^{th}$ century in terms of the traditional poetic literature, in the presence of the printing technology. It was in this period that the foundation to the origin of the modern poetic literature was created, most of which are instrumental in identifying the thoughts and perspectives of the people who lives in that particular period. The purpose of this research article is to address the social perspective of the common poets as it is brought out by the poetic creations that took its origin in the 19$^{th}$ century.

## ක්ෂණික කාව්‍ය බන්ධන ඉතිහාසය සංක්ෂිප්තව හඳුනා ගැනීම

සියලු ම කලා අතුරෙන් සිංහලයෝ කාව්‍යයය අතින් මනා කුසලතාවක් දැක් වූහ. කාව්‍යය සිංහලයාගේ ආත්මය අයිතිකරගෙන සිටියහ. එසේ හෙයින් අනෙක් කලාවන් මුළුමනින් ම වාගේ මැකී ගිය අතර කාව්‍යය නොනැසී පැවැතියේ ය. සිංහල භාෂාව කාව්‍යය සඳහා සුබ නම්‍ය වෙයි. (ගොඩකුඹුර 1999: 50) පුරාතන කාල පරිච්ඡේදය තුළ ලියැවී ඇති පද්‍ය කෘතීන්ගේ නෂ්ටාවශේෂ පුරාතන සාහිත්‍ය ග්‍රන්ථයන්හි විද්‍යමාන යි. අටවන සියවසට පෙර සිංහල පද්‍ය ඉතා උසස් මට්ටමක නැග තිබුණු බව පෙනේ. (ගොඩකුඹුර 1999: 150) පැරණී ගී කාව්‍යය පිළිබඳව ආදිතම ප්‍රශස්ත නිදර්ශන සීගිරි ගී වලින් දැක ගත හැකි යි. (සෙනවිරත්න 2007: 15) සීගිරි කවිනට තම ප්‍රබන්ධයන් සඳහා වස්තු විෂයය වූයේ වැඩි වශයෙන් බෙයදෙහි ඇඳ ඇති ලලනා සිත්තම් ය. එහෙත් සමහරුන්ගේ නෙත් සිත් යොමු වූයේ පර්වතය කෙරෙහි ය. තවත් සමහරුන්ගේ නෙත් සිත් පැහැර ගත්තේ කැටපත් පවුර ය. සමහරුන්ගේ නෙත් සිත් රාජ මාලගය කෙරෙහි යොමු විය. සමහරුන්ගේ සිංහ රූපය කෙරෙහි ය. සමහරු අවට සෞන්දර්ය කෙරෙහි යොමු වූහ. මෙසේ විවිධ අත්දැකීම් හා විවිධ කාව්‍යමය සිතුවිලි අපට ඒ රචනා තුළින් දක්නට පුලුවන. (සෙනවිරත්න 2007: 26 ) සීගිරි ගී හැරුණු විට මුවදෙව්දාවත, සසදාවත, ගී කාව්‍යයන් ද කව්සිළුමිණ හා ගම්පළ හා කෝට්ටේ යුගයන්හි පද්‍ය කෘතීන් ද විශේෂ අවධානය යොමු කළ යුතු වේ. කෝට්ටේ යුගයේ දී රචිත පැරකුම්බා සිරිත හා තදාශ්‍රිත වු සාහිත්‍ය ක්ෂණික කාව්‍ය බන්ධනයෙහිලා විශේෂ අවධානය යොමු කළ යුතු අවස්ථාවකී. විශේෂයෙන් කවිකාර මඩුවේ දී ක්ෂණික කාව්‍ය බන්ධනයන් සිදු වු බව පෙනේ. රජවරුන් පිනවීම සඳහා විවිධ කීම් පද, පද උදුරා කීම් තරගයට කීම් හා සංවාද ආදි වශයෙන් සුවිශේෂතා දැක ගත හැකි යි. (ඉහළගම 2015: 214) එවන් අවස්ථාවල දී කාව්‍යයන් නිර්මාණය කර ඇත්තේ ක්ෂණිකව ය. විවිධ කරුණු අරභයා කළ සංවාදාත්මක කවි ද මෙන් ම වෙනත් තේමාවන් අරභයා සිදු කළ කාව්‍යයන් ද දැක ගත හැකි යි. ඇතැම් අවස්ථාවල දී කේවල කවි වශයෙන් පමණක් නොව සංවාදාත්මක කාව්‍යය වශයෙන් ද දැක ගත හැකි යි. ක්ෂණික බන්ධන කාව්‍යය ජනතාව අතරට සමීප කරවන්නට බල පෑ ප්‍රබල සාධකයක් වනුයේ භාවිත බසෙහි පැවැති සරල බව යි. ජන කවිය පෝෂණය සඳහා ද මෙම ක්ෂණික කාව්‍යයන් බලපාන්නට විය. එමෙන් ම රජවරුන් පවා ක්ෂණික කාව්‍ය බන්ධනය කෙරෙහි යොමු වී ඇත බව පෙනේ. එකිනෙකාට ඇනුම් පද කීම් වශයෙන් රචනා වු පද්‍යයන් ද දැක ගත හැකි යි. රාජාධිසිංහ රජුගේ කවිකාර මඩුවේ සිටි කැකිරිගොඩ කවියා තවත් කවියෙක් සමග තරඟයට කවි කියා ඇත්තේ එකිනෙකාගේ පෞද්ගලික තොරතුරු ද ප්‍රකාශ කරමිනි.

ඇතුල් පැත්ත පිට පැත්ත නොදන්නා
කිතුල් පිත්ත උඩ පියවර මැන්නා
උකුල් ඇටෙන් උගෙ එළියට පැන්නා
එහෙව් එකත් කවි කීමට එන්නා

කැකිරිගොඩ කවියාගේ පෞද්ගලික තොරතුරු නොදන්නා අනෙක් පාර්ශ්වයේ කවියා අපහාසාත්මක කවියක් මෙසේ කීවේ ය.

මූට මුගේ මවු බඩ ගැබ්බරින් සිටිය කල එදිනේ
රෑට කැකිරි ගොඩක් උයා කුස ගින්නට කාපු තැනේ
රෑට බඩේ රුජා පැහැර මේකා උප්පාද උනේ
මූට ඒක තමයි කැකිරිගොඩ නම හාමුදුරුවනේ

(සාසනතිලක හිමි 1973: 23)

තත් කාල පරිච්ඡේදයෙහි ප්‍රකටව සිටි පිදුරුවැල්ලෙ කවියා, අඹන්වෙල රාල ද, මිදෙල්ල කවියා ද සම්බන්ධයෙන් ඉතා රසවත් සිදුවීම් දකින්නට හැකි වේ. මිදෙල්ල කවියා තමන් සතුව පැවති ඇතැම් දෑ සොරකම් කිරීම නිසා කියූ වස්කවි ද දැක ගත හැකි යි.

ඉස මොළළ කබලේ සිට උගේ අක්මා පෙණපපු කැවුත්ත
ඇස බැම සහ නළල බෙල්ල දැත් ඇඟිලි එනිය පොත්ත
රස දිවයන උගුර ඇතුළ සහ පිටිකර දෙඋර පත්ත
දෙස බඩවැල ඉග පෙකණිය හතරට පැලියන් ළපැත්ත

(ශීලක්ඛන්ද හිමි - පද්‍යය 8)

මෙසේ ක්ෂණික බන්ධන වශයෙන් පවතින බොහෝ පද්‍යයන් ජන කවි වශයෙන් ද ප්‍රචලිත ය. විශේෂයෙන් ම මහනුවර මාතර සාහිත්‍ය කාල වකවානුවේ දී ගජමන් නෝනා, ඇලපාත මුදලි ආදි කවි කිවිදියන්ගේ නිර්මාණයන්හි ද ක්ෂණික කාව්‍ය බන්ධනයන් දැක ගත හැකි යි. සිංහල සාහිත්‍ය ඉතිහාසයෙහි 19 වන ශතවර්ෂය යනු පද්‍ය සාහිත්‍යයෙහි සංක්‍රාන්ති කාල පරිච්ඡේදයකී. මෙකී කාල වකවානුව තුළ කුඩා ප්‍රමාණයේ පද්‍ය කාව්‍යයන් විශාල ප්‍රමාණයක් බිහි වු අතර බොහෝ පද්‍යය ආඛ්‍යානය ස්වරූපයෙන් යුක්ත ය.

### 19 වන ශතවර්ෂයෙහි සමාජාර්ථික පසුබිම

යුරෝපීය ජාතීන් '**නූතන ලෝකයේ**' ක්‍රමයෙන් වර්ධනය වෙමින් පැවති ආර්ථික බලය අල්ලා ගැනීම හා තවත් අප්‍රධාන පරමාර්ථ සාධනය උදෙසා ආසියා හා අප්‍රිකා මහාද්වීපයන්හි ස්වාධීන රාජ්‍ය අත්පත් කර ගැනීමට යොමු වීම ලෝක ඉතිහාසයේ නව පරිච්ඡේදයක ආරම්භය සලකුණු කරයි. (Wickramasinghe 2006: 26) සොළොස් වන සියවසේ සිට වරින් වර ශ්‍රී ලංකාව යුරෝපීය ජාතීන්ගේ බලපෑම්වලට ලක් වීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් සිදු වූ සංස්කෘතික විපරිණාමය සිංහල භාෂාව හා සාහිත්‍යය නවමඟක් කරා යොමු කිරීමෙහි හේතු වූ ආකාරය විද්වතුන්ගේ අවධානයට යොමුවී තිබේ. මේ අතරින් වඩාත් තීරණාත්මක වූයේ දිවයින කෙරෙහි බ්‍රිතාන්‍ය ජාතික ඉංගිරිසීන්ගේ බලපෑම යි. ඉංගිරිසීන්ගේ මෙරට ආධිපත්‍යය කාල වකවනු වශයෙන් සියවස් එකහමාරකට සීමා වන නමුදු ඔවුන් මුළු දිවයින ම ග්‍රහණයට ගැනීමට සමත් වීම හේතුවෙන් සෙසු යුරෝපීය ජාතීන් දිවයිනෙහි සමුද්‍රාසන්න

ප්‍රදේශ පාලනය කළ අවධීන්හි සිදු වූ බලපෑම්වලට වඩා ඉංග්‍රීසී පාලනය හේතුවෙන් වූ බලපෑම් දේශීය සමාජයේ සෑම අංශයක් කෙරෙහි ම පැතිරීම එහිලා විශේෂ වෙයි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් පුරාතනයේ පටන් ලංකාවේ පැවති සමාජ ආර්ථික සංස්ථා බ්‍රිතාන්‍යය පාලන සමය තුළ ශීඝ්‍ර පරිවර්තනයකට ලක්විය. බ්‍රිතාන්‍ය පාලන සමය ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික වර්ධනයේ සන්ධිස්ථානයක් ලෙස ද හඳුන්වනු ලැබේ. දේශපාලන බල ව්‍යාප්තිය හා නව පාලන ක්‍රමයක් ස්ථාපනය කිරීම දිවයිනේ බ්‍රිතාන්‍ය පාලනයේ ප්‍රධාන අංගය වුව ද ඊට සමගාමීව ලංකා ජනතාවගේ නිවාස, ආහාර පාන, ඇඳුම් පැලඳුම් හා ගමනාගමනය ආදි සියලු අංශය විපරිණාමය විය. තදනුබද්ධ ව ශ්‍රී ලාංකික මිනිසාගේ චින්තනයෙහි ද වෙනසක් ඇති වූ අතර එය ආකස්මික ව සිදු වූවක් නො ව යටත් විජිත පාලනය විසින් ප්‍රෝත්සාහයෙන් සිදු කරන ලද්දක් බව පෙන්වා දියහැකි ය. (Perera 1955: 86) දිවයිනේ යටිතල පදනම වෙනස් කිරීම සඳහා කොමිෂම විසින් රාජකාරි ක්‍රමය අහෝසි කිරීම, මිෂනාරි අධ්‍යාපනය ආරම්භ කිරීම, ඉංග්‍රීසි අධ්‍යාපනය ව්‍යාප්ත කිරීම, මුද්‍රණශිල්පය ආරම්භ කිරීමට අනුබල දීම යන නිර්දේශ දක්වා තිබීමෙන් පෙනී යන්නේ ආර්ථික පදනම මෙන් ම චින්තන රටාව ද කෙරෙහි බ්‍රිතාන්‍ය පාලකයන් අවධානය යොමු කළ ආකාරය යි. මේ නිර්දේශ අතරින් නව සාහිත්‍යයක ප්‍රභවයට හේතු වූ කරුණු කෙරෙහි මෙහි ලා අවධානය යොමු කෙරේ. (Mendis 1956 : 233)

කෝල්බ්රුක් යෝජනා මගින් ආරම්භ වූ මුද්‍රණ තාක්ෂණය යනු දැනුම ව්‍යාප්ත කිරීමේ ප්‍රධාන ම සාධකය වේ. (Colbrook Cameron reports. Vo. 1, 75) බ්‍රිතාන්‍ය පාලකයෝ තම පරිපාලන ක්‍රියාදාමය පහසු කර ගැනීම සඳහා මුද්‍රණ ශිල්පය යොදා ගත්හ. මුද්‍රණ තාක්ෂණය ලංකාවේ ව්‍යාප්ත වීම ඇරඹෙන්නේ බ්‍රිතාන්‍ය යුගයට පෙරාතුවය. ඉන්දියාවට මුද්‍රණ තාක්ෂණය හඳුන්වා දෙන ලද්දේ පෘතුග්‍රීසින් විසින් වුව ද දිවයිනේ සමුද්‍රාසන්න ප්‍රදේශ පාලනය කළ පෘතුග්‍රීසින් මෙරටට මුද්‍රණ තාක්ෂණය හඳුන්වා දීමට උනන්දුවක් දැක්වූ බවක් නොපෙනේ. (Kularathna 2006:9) 19 වන සියවසේ ආරම්භය පටන් ම පුවත් පත් හා සඟරා යන මාධ්‍ය දෙකින් ම ජන විඥානය සකස් කිරීම කෙරෙහි සැලකිය යුතු කාර්යයක් ඉටු කෙරිණි. සියලු ම වාද විවාද සිදු කරන ලද්දේ පුවත්පත් හා සඟරා මගිනි. මේ සඳහා කථා ව්‍යවහාර භාෂාව උපයෝගි කර ගන්නා ලදි. එමෙන් ම සිංහල හා ඉංගිරිසි මාධ්‍ය දෙකෙන් ම ලිපි පුවත්පත්වල පළ වන්නට විය. බටහිර මෙන් ම දේශීය කතා ද පුවත්පත්වල පළ විය. මෙමගින් මිනිසාගේ කතා කියැවීමේ රුචිය වැඩි විය. නවකතා වැනි නවතම සාහිත්‍යාංග උත්පාදනය සඳහා මෙම පසුබිම බලපාන්නට විය. පුවත් පත් හා සඟරා වැඩි වැඩියෙන් සමාජගත වීමේ දී ඇතැම් පිරිස් නිර්මාණශීලි පද්‍යයන් පුවත්පත්වල පළ කිරීමේ අවශ්‍යතාව ඇති විය. මෙම තත්ත්වය නව පද්‍ය සාහිත්‍යයකට පසුබිම ගොඩ නැඟීමක් ද විය. (සරච්චන්ද්‍ර 1997 : 27)

මුද්‍රණ ශිල්පය 19 වන සියවස ආරම්භයේ සිට ව්‍යාප්ත වුව ද පද්‍ය කෘතින් මුද්‍රණයෙන් බිහි වන්නේ 1860ත් 1900 අතර කාල පරිච්ඡේදය තුළ දී ය. කොළඹ, ගාල්ල හා දොඩන්දූව යන ප්‍රදේශයන්හි මෙම මුද්‍රණ කර්මාන්ත ස්ථාපිත වී තිබිණි. ලංකාලෝක, ලක්මිණි පහන,

සරස්වතී, ලංකාභිනව විශ්‍රැත, චන්ද්‍රාලෝක, සුරතුර, ශ්‍රී ධර, ග්‍රන්ථ ප්‍රකාශක, ලක්මිණි පලඟ, ශාස්ත්‍රධර, විද්‍යා ප්‍රකාශ, දිනකර, ධර්මවර්ධන, විද්‍යාසාගර යනාදි මුද්‍රණාලයන් 19 වන සියවසේ අවසානයෙහි මුද්‍රණ හා ග්‍රන්ථ ප්‍රකාශන කර්මාන්තයෙහි නිරත විය. ඇතැම් කතුවරු තමන්ගේ වියදමින් ම පොත් මුද්‍රණය කළහ.

ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනය විසින් දිවයිනට මුද්‍රණ ශිල්පය හඳුන්වා දෙන්නේ එමගින් ලාභ ඉපයීමේ අදහසකින් නො වන බව පෙනේ. ක්‍රිස්තු ධර්මය ව්‍යාප්ත කිරීම හා රජයේ ප්‍රවෘත්ති ජනතාව වෙත පැතිරවීම මුද්‍රණාල පිහිටුවන ලදි. මුද්‍රණ ශිල්පය යනු ලාභදායි ව්‍යාපාරයක් බව පෙනී ගිය විට ලාභ අපේක්ෂාවෙන් ග්‍රන්ථ නිෂ්පාදනය ආරම්භ විය. මුද්‍රණ ව්‍යාපාරිකයෝ වැඩි වශයෙන් ම ගුණාත්මක බවින් අඩු ග්‍රන්ථ නිෂ්පාදනය කෙරෙහි යොමු වූහ. (chandasiri 2018 :) මුදල රජයන සමාජයක් තුළ ඉතා ම ලාභදායි ව්‍යාපාරයක් ලෙසින් මුද්‍රණ ශිල්පය ගොඩ නැගෙන්නට වූ බව බෙනඩික් ඇන්ඩර්සන් මුදල රජයන සමාජයක් තුළ ඉතා ම ලාභදායි ව්‍යාපාරයක් ලෙසින් මුද්‍රණ ශිල්පය ගොඩ නැගෙන්නට වූ බව පවසයි. (Anderson 1983: 38) මෙම පසුබිම තුළ ඉතා ම ලාභදායි නිෂ්පාදන ජනතාව අතර ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වූ අතර අලුතින් බිහි වුණු පොත් සමඟ නව පාඨක පිරිසක් ද බිහි විය.

19 වන සියවස අවසාන දශක කිහිපයෙහි මුද්‍රණයෙන් ප්‍රකාශයට පත් වී ඇති සිංහල ගද්‍ය හා පද්‍ය කෘති විශාල සංඛ්‍යාවකි. මේ කෘති මඟින් තත්කාලීන සමාජ සංස්ථා ද හඳුනා ගත හැකි ය. එයින් පෙන්නුම් කරනුයේ නූතන සමාජ ප්‍රවේශයත් සමග ම ජන ජීවිතය ද ශීඝ්‍රයෙන් වෙනස් වී යන බවකි. මුද්‍රණ සංස්කෘතිය මගින් මිනිසා පරිසරය හා සමාජය පිළිබඳ චින්තනය ද වෙනස් විය.

නීරා වික්‍රමසිංහ පෙන්වා දෙන පරිදි විශාල වශයෙන් පැවති වාචික සංස්කෘතිය විශේෂයෙන් ජාතක කථා හා ජනප්‍රිය කතා මුද්‍රිත පත්‍රිකා සේ ප්‍රකාශයට පත් විය. (Wickramasinghe 2006: 77) ඇතැම් ප්‍රකාශන කවි කොළ ස්වරූපයෙන් නිකුත් කෙරුණු අතර ඒවා වෙළඳ පොළේ දී මෙන් ම වන්දනා ස්ථානවල දී ද විකුණු අතර සාමාන්‍ය අකුරු හැකියාවක් ඇති ස්වදේශීය අධ්‍යාපනය ලැබූ පිරිස මේවාහි පාඨකයන් බවට පත් විය. ජාතක කතා හා ජනප්‍රිය කතා මෙන් ම සමකාලීන සිදුවීම් වස්තුකොට ගත් පද්‍ය ආඛ්‍යාන ද 1860න් පසුව බිහිවන්නට විය. මේවා විවිධ තේමා යටතේ රචනා වී තිබිණි.

නූතන පාඨක පිරිස අතර එතරම් ජනප්‍රිය නොවූ ලේඛකයෝ ද මෙකල පුස්තිකා හා කවි කොළ මාර්ගයෙන් පාඨක ලෝකයට ප්‍රවිෂ්ට වූහ. මොවුන් අතර අප්පුහාමි අර්නස්ට් ජයසූරිය, අප්පුහාමි කරෝලිස්, අප්පුහාමි මන්තෙස්, ජේම්ස් අප්පුහාමි, ඉදිරිසිංහ, ගන්දර දොන් අන්දරිස් කොරනේලිස් සේනානායක, මාතලේ නැකැත්තා, පබිලිස්, දොන් පිලිස් ඇපා අප්පුහාමි, නන්දන කවිශේඛර, විජේවීර ආදි රචකයන්ගේ නම් දත හැකි වේ. (chandasiri 2018:) මොවුන්ගේ නිර්මාණ ජන කාව්‍ය නිර්මාණ ද නො එසේ නම් චූල සම්ප්‍රදායේ නිර්මාණ ද යන්න කාව්‍ය සම්ප්‍රදාය හා භාෂා ලක්ෂණ, රචනා රීතිය යන අංග විමර්ශනයෙන් හඳුනා ගැනීම අවශ්‍ය ය. විවිධ වස්තු විෂයය යටතේ රචනා වී ඇති කාව්‍ය කෘති අතුරින්

වැඩි ම ප්‍රමාණයක් දැක ගත හැකි වන්නේ ශෘංගාරාත්මක අදහස් ඇතුළත් පද්‍ය රචනා ය. අනෙක් විෂයය වී ඇත්තේ සමාජ සිද්ධි හා ආගමික උත්සව වර්ණනා කිරීමයි.

**තෝරාගත් පද්‍ය කාව්‍යය විමසීම**

තත් අවධියෙහි පද්‍ය රචකයන්ට විවිධ මාතෘකාවන් විෂය වී ඇති බව පෙනේ. ලංකා කෞතුකාගාර පුස්තකාලය හා බ්‍රිතාන්‍ය මහා පුස්තකාලයෙහි ද දක්නට ඇති පද්‍ය පුස්තිකා මෙහි ලා විශේෂයෙන් අවධානය යොමු කළ යුතු යි. මෙම පද්‍ය මගින් සමාජයේ විවිධ පැතිකඩ විවරණය කිරීම මෙහි දි දැක ගත හැකි විශේෂ ලක්ෂණයකි. "**නඩු කීම හා පෙරකදෝරු**' යන පද්‍ය කෘතිය අපූර්ව අවස්ථාවක් බව දැක ගත හැකි යි. මෙවන් කාව්‍ය කෘති සරච්චන්ද්‍ර මහතා පද්‍ය ආඛ්‍යාන වශයෙන් ද හඳුන්වා දී ඇත. එක්තරා ගැමියකුට තමන්ගේ ඉඩම් ආරවුලක් විසදා ගැනීම සඳහා පෙරකදෝරුවකුගේ සහාය අවශ්‍ය විය. මෙහි දී මාතර ප්‍රදේශයේ එක්තරා ප්‍රකට පෙරකදෝරුවෙක් ළගට ගොස් තමන්ගේ කාරණය පැවසීමෙන් අනතුරුව නඩුවක් සූදානම් කරයි. නඩුව ආරම්භ වූ මොහොතේ සිට නඩුව අවසන් වන තුරු ගැමියාගෙන් පෙරකදෝරු තැන විවිධ අල්ලස් ලබා ගන්නා ආකාරය ඉතා රසවත් ලෙස විස්තර කර ඇත. ගැමියාගේ සියලු ම ඉඩ කඩම් ද විකුණා පෙරකදෝරු තැනට මුදල් දීම සිදු කරන අතර ම පෙරක දෝරු තැන කියන සියලු ම දෑ ගෙනත් දීමට ද ගැමියා කීකරු වී ඇත.

දෙසිත් දොඩන් ජමනාරණ් ර සේ යා
වැලත් සමග වරකා ගෙණ තො සේ යා
අළුත් වැලි හකුරු මුල් බැඳ මෙසේ යා
ගෙණැත් දෙව කන්ඩ නෝනටය සේ යා

කිරිත් මිදුනු හොඳ පැනිමුල් හැටි අටි
අළුත් ගිතෙල් සහ කන තෙල් තුටි වැටී
කහත් ගොරක මුළු බඳමින් හැටි අටී
ගෙනැත් දෙව කන්ඩ නෝනට තුටි වැටි

ගොසින් පෙනි සිටිකල ඒ තුමා පෙ මා
ඉතින් තව එකක් කියනෙමි සිතසෙ මා
සොඳින් කිරි කන්ඩ නෝනට අමා පෙ මා
ගොසින් මී දෙනෙක් ගෙණ එව නොවීප මා

දවල් සෙල්ලමට නෝන ට
වඳුරෙක් ගෙණ දෙව සහතු ට
එසේ ගෙණැත් දුනොත් මෙම ට
කරුණක් වෙයි නඩු දිනුම ට

අවුරුදු තුනක් තිස්සේ නඩු කිවු පසු නඩුව පැරදි ගැමියාගේ විනාශය සිදු වූ ආකාරය ද පෙන්වා දෙයි. මෙය හුදෙක් එක් පුද්ගලයෙකුගේ ජිවිතයෙහි පැතිකඩක් නොව තත්කාලීන නිලධාරි පැලැන්තියේ ම ඇති වූ දුරුවතාවක් බව කවියා පෙන්වා දෙයි.

මෙ කියන අවුරුදු ඇතුල ත
ගම බිම වතු විකුන බූදි ත
කළ වෙලදම් ගොවිතැන් නැ ත
පෙමකර අඹුදරු නොතක ත

ගේත් සෙවිලි කර ගන්ට ත්
ටිකකුත් නැත අවකාස ත්
වැටත් දිරා ගිය බෝග ත්
මොකවත් නැත රැකුමට ව ත්

(පෙරකදෝරු හටනේ, පොතක මිළ පනම් 3, අච්චු ගස්වන්ට යෙදුනේ කොළඹ දී ය 1869 - බ්‍රිතාන්‍ය පුස්තකාලය)

සාම්ප්‍රදායික චින්තනයෙහි සිර වී සිටි ජනයාට මුද්‍රණ ශිල්පය නිසා ලැබුණු නිදහසත් සමග තම මතයන් සමාජගත කරන්නට ද හොඳ අවස්ථාවක් ලැබිණි.

19වන සියවසේ කාව්‍ය රචකයන්ගේ නිර්මාණ සඳහා පැහැදිලිව ම තමන් ජීවත් වූ වට පිටා පරිසරයේ ම තමා අත් දුටු සමාජ සිද්ධි ම පාදක වී ඇත. භික්ෂූන්වහන්සේ සහ සමාජයේ ගෞරවයට පාත්‍ර වූ චරිතයන් ද පද්‍යයෙන් වාර්තා කිරීම මෙහි ලා දැක ගත හැකි යි. එය තත් කාලීන සමාජයෙහි සංස්කෘතිය පසුබිම පිළිබිඹු කරන්නකි. සිංහල හා මුස්ලිම් ජනවර්ග දෙක අතර විවාහයක් සම්බන්ධයෙන් ඇති වූ අරගලය ද තත්කාලීන සිදුවීම් අතර වඩාත් රසවත් සිද්ධියක් විය. මොරටුවේ කරාව කුලයට අයත් තරුණයෙක් කොළඹ අලුත් පාරේ යෝනක ගෙදරක ගැනියක් සමග අනියම් සම්බන්ධකමක් පවත්වා ඉන් අනතුරුව මේ දෙදෙනා අතර මිත්‍රකමක් ගොඩ නැගිණි. මෙම තරුණයා මරක්කල තරුණිය රැගෙන මොරටුවට යයි. (මරක්කල හටනේ හෙවත් සිංහල මරක්කල කොලාහල 1891) මේ සිදුවීමත් සමග කොළඹ හා මොරටුව ප්‍රදේශයන්හි ඇති වූ කලබලකාරී ස්වභාවයත් පොලීසිය මැදිහත් වී එය විසඳු ආකාරය ද මෙහි දී ඉතා සිත් ගන්නා ලෙස වර්ණනාවට ලක් කර ඇත. මුස්ලිම් ජනයා තුළ පැවැති දැඩි මතවාද ස්වභාවය ද මෙහි දී හඳුනාගත හැකි වේ. (32. 34 . 40. 56 . 65 . 87 පද්‍යය) නව සමාජ ව්‍යාපාරය හරහා ගොඩනැගුණු ප්‍රභූ පැලැන්තියේ මෙහෙකාරකමට පැමිණෙන ජනයා අප්පු, ඇයා ආදි නම්වලින් හැඳින් විණි. කොළඹ නගරාශ්‍රිත නිවාසවල මෙහෙවරෙහි නිරත කාන්තාවන්ට නිරන්තයෙන් ම විවිධ අතරයන්ට මුහුණ පාන්නට සිදු වූ අවස්ථා ද දැක ගත හැකි යි.එමෙන් ම ගෘහ සේවාවන්හි නිරත වන සේවික සේවිකාවන් අතර ඇතිවෙන අනියම් සම්බන්ධතා ඉතා සීඝ්‍ර ලෙස වර්ධනය වූ බවක් ද දැක ගත හැකි යි. (ජේ. ඒ. **ආයාසෝකමාලය,** 1893ඃ 115

පද්‍යය.) තමන් සේවය කරන ස්ථානයේ දීම මෙම අනියම් සම්බන්ධතා ගොඩ නැගෙන ආකාරය ද වාර්ථා කරයි.

ඇහැට කාබි තෙලත් වැටී ලා
කාටනුමුත් මන දෙන්නට සිති ලා
රෑට කුස්සියේ දී අප්පුව ලග ලා
ඌට පහසදෙති කිසිවත් නොබ ලා

ආයලා (ජේ. ඒ. **ආයාසෝකමාලය,** 1893: 2,6 පද්‍යය.)

(ඉතා හොදට කා බී රාත්‍රි කාලයේ දී කුස්සියේ දී අප්පු සමග කාම සේවනයෙහි යෙදෙයි)

වැඩකාර සේවායෙහි නිරතව සිටින මෙවැනි තරුණියන්ට අවසානයේ දී අනියම් හැසිරීම් හේතුවෙන් ගැබ්බර කාන්තාවන් බවට පත් වී ඉතා අසරණ වන බව ද දැක ගත හැකි යි. අවසානයේ දී රජයේ රෝහල පිහිටට පමණක් තිබෙන බව (ආයසෝකමාලය 8 පද්‍යය) පැවසීමෙන් පැහැදිලි වන්නේ නව සමාජ ක්‍රමය යටතේ නාගරිකරණයට ලක්වන ග්‍රාමීය ජනයාගේ ජීවන රටාව සාම්ප්‍රදායික පිළිවෙතින් වෙනස් වන ස්වභාවය වේ. යටත් විජිතවාදිහු විවිධ අවස්ථාවල දී විවිධ බදු වර්ග අය කළහ. මේ බදු අතර තිරිසන් සතුන් සඳහා විශේෂයෙන් ම සුනඛයන් සඳහා ඇති කරන ලද බදු මුදල විශේෂ කොට සැලකිය හැකි ය. **සුනක විලාපය** වූ කලි සුනඛයන්ගේ මරණය පිළිබඳව සුනඛයන් දුක ප්‍රකාශ කරන ආකාරයෙන් නිර්මාණය කරන ලද්දකි. පොලීසිය යොදා තමන්ගෙන් බද්දක් අය කර ගැනීම ඉතා ම අසාධාරණ ක්‍රියාවලියක් බව ද පැවසයි. (සුනක විලාපය ,1893. 16 පද්‍යය) මෙම ප්‍රකාශයන් මගින් වක්‍රාකාරයෙන් පැහැදිලි කරනුයේ මෙම යටත් විජිත නව පාලනය ක්‍රමය ස්ථාපිත කිරීමට පූර්වයෙන් කිසිදු දුකක් නැතිව තමන් ඉතා හොදින් ජීවත් වූ බවකී. යටත් විජිතවාදීන්ගේ මෙවැනි පාලන ක්‍රමයන්ට විරෝධතාවන් දැක්වීමට කවුන්සිලයට හෙවත් පාලන මධ්‍යස්ථානයට ගොස් පවසනවා යනුවෙන් පැවසීමෙන් මෙම ප්‍රතිවිරෝධතාවන් ඉස්මතු වීමේ ස්වභාවය හඳුනා ගත හැකි වේ.

නව සමාජ මතවාද සමාජයෙහි ස්ථාපිත වන කල්හි සාම්ප්‍රදායික මත හා ආකල්ප අභියෝගයට ලක් විණි. ඒ තුළ විවිධ පරස්පරතාවන් ද මතු විණි. යටත් විජිත සමාජය හරහා ගොඩ නැගුණු තාක්ෂණික ඥානය ලාංකේය ජන ජීවිතය පැහැදිලි වෙනසකට යොමු කරන්නට සමත් විණි. භෞතික පරිසරය මෙන් ම ආධ්‍යාත්මික ජීවිතය ද නව සමාජ ක්‍රමය තුළ අභියෝගයට ලක් වෙමින් වෙනස් වන ආකාරය ද පැහැදිලි ම හඳුනා ගත හැකි ය.

බීමත්කම හා මිනී මරුම් අතර පවත්නා සම්බන්ධය පිළිබඳව තොරතුරු ඉදිරිපත් කිරීමට ද කවියන්ගේ අවධානය යොමු වී ඇති බව දතහැකි ය. **අලුත් කඩේ උසාවිය ළඟදී සිදු වුණ මරණයක් හෙවත් දුලීයානු කථාව නොහොත් අවවාද මල්දම** වූ කලි අලුත් කඩේ උසාවිය අභියස දී සිදු වූ මිනී මැරුමක් හා සම්බන්ධ වූ සිද්ධියක් මීට වස්තු විෂය වී ඇත.

මෙම සිද්ධියේ දී මිනිමැරුම කළ තරුණයා මත්පැන් පානය කළ බව පැහැදිලිව ම දක්වා ඇත.

බොමින් සුරාබෝතලයක් මන්නා මිල දීලා අතිනේ - මම
අරන් පිහියෙකුත් කඩේ ගොසිල්ලා දූලියට අන්න මෙනේ
ලගින් සිටන් මම බීපුමතින් දූලියානුට ඇන්න තැනේ - එම
සැනෙන් පියුන්වරුවටලා ඇවිදින් රෙකුලාසිය ලෙසිනේ

(20 පද්‍යය)

භික්ෂුවගේ උපසම්පදාව පිළිබඳව සැලකිලිමත්වීම සාම්ප්‍රදායික සමාජ සම්මතය වේ. උපසම්පදාව පිළිබඳව සිතීම යති සම්ප්‍රදායේ ප්‍රබල සංකේතයක් ද වේ. උපසම්පදාව හා සීමාව ද එකට බැඳුණු සංසිද්ධි දෙකකි. (විනය පිටකය - මහා වග්ග පාලිය - ද්වීතිය භාගය) කවියන්ගේ දෘෂ්ටිය උපසම්පදාව කෙරෙහි වැඩි අවධානය යොමු නොවුවත් උපසම්පදාව පිළිබඳව ඇති ආකල්පය සමාජයෙහි මුල් බැස ගත්තකි. මවක් හ දියණියක් අතර ඇතිවෙන සංවාදයකින් පෙන්වා දෙන්නේ වඩාත් ප්‍රබල තත්ත්වයක පසුවන්නේ සාමණේර භික්ෂුව ද එසේ නැතහොත් උපසම්පදාව භික්ෂුව ද යන්න වේ.

වැඩිමහල් දූව

ගැණලා දෙන දෙයට වඩම්මවන මන තු ට
නොබලා යෙදුනු නොමුත් දෝය පසුව ට
ලොබලා සාමණේරයකු ගතිමි පහස ට
අවලාය කියද්දෝ මැනියනි ම ට

(සිතේ සතුටින් යුක්තව පහස විඳීම සඳහා සාමණේරයකු ගත්තෙමි. මේ නිසා මැණියනි මට අවලාද නොකියන්න)

මව්

සැපතින් වදා ඇති කළ දෝනියනි සෙ සෙමා
නුඹ දූන් මෙදා කළ කාරිය අරුමකි මා
රතිකම් සඳා අපහසකර තත් සැ වොමා
උපසම්පදා කෙනෙකුන ගෙන්නම් මෙ මා

(දියණිය නුඹ කරන ලද කාර්යක අරුමය කුමක්ද . රති සැප විඳීම සඳහා මම උපසම්පදා කෙනෙකු ගෙන්වා ගත්තෙමි.)

වැඩිමහල් දූව

කළත් ලොව කෙතෙක් නිසි නින්දා කම් මේ
ගියත් වයස රතිසැප විඳනැති නිම් මේ
නුඹත් ගෙන්නු කළ දූන් මහණෙකු අම් මේ
මමත් ඉතින් තව ගණිතොතින් මහණු ම් මේ

(ලෝකයෙන් කොතරම් නින්දා අපහස පැමිණියත් මැණියන් ද මහණ කෙනෙකු ගත් කල්හි මමත් තවදුරටත් රති සැප විඳින්නට කෙනෙකු ගන්නේ නම් ඒ මහණ කෙනෙකු මිස වෙන කෙනෙකු නොවේ)

මෙම කාව්‍යයන් විමර්ශනය කිරීමේ දී පැහැදිලි වන්නේ හුදෙක් කේවල හෝ ආඛ්‍යායන ස්වරූපයෙන් නිර්මාණය වී ඇති පද්‍ය මගින් තත්කාලීන සමාජ සංස්ථාව පෙන්නුම් කරන අතර ම කවිය හුදෙක් නිර්මාණාත්මක ලක්ෂණවලින් හෙබි ගුණාත්මක බවින් යුක්ත කාව්‍ය සම්ප්‍රදායක් ගොඩ නැගීමට වඩා කවියන් පෙළඹී වී ඇත්තේ තම සිතැගීන් කවිය මාර්ගයෙන් ප්‍රකාශ කිරීම වේ. මේ තුළ ක්ෂණික කාව්‍ය බන්ධනයන් ද ප්‍රකට ය.

## 3. නිගමනය

තත්කාල පරිච්ඡේදයේ දී මුද්‍රණ සංස්කෘතිය ලංකාවේ ස්ථාපිත වීමත් සමග ක්‍රමයෙන් ශ්‍රාවක පිරිස පාඨක පිරිසක් බවට පරිවර්තනය විය. ජනයාගේ චින්තනය ක්‍රමයෙන් ප්‍රසාරණය වූ අතර ම තම සිතැගීන් සමාජය හමුවෙහි තැබීමට මුද්‍රිත ප්‍රකාශන ඉවහල් කරගන්නට විය. එමගින් තත් අවධියෙහි විසූ ජනයාගේ රුචිකත්වය , අවශ්‍යතාව හා සමාජ ප්‍රතිවිරෝධතාවන් ද හඳුනා ගත හැකි වේ.

## 4. ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


අනුරාධ සෙනෙවිරත්න , සිංහල ගී කාව්‍ය සංග්‍රහාය , ගොඩගේ සහ සහෝදරයෝ, 2007

අප්පුහාමි කරෝලිස් , **සුනක විලාපය** ,1893.

එදිරිවීර සරච්චන්ද්‍ර, ''මාතර - කොළඹ කෘතිවලින් අපේ සාහිත්‍ය ක්ෂේත්‍රය පළල්ව ගිය හැටි'', **සාහිත්‍ය ධාරා**, සංස්ඃ ජී. ජී. පුංචිහේවා, කොළඹඃ 1960.

එදිරිවීර සරච්චන්ද්‍ර, **සිංහල නවකතා ඉතිහාසය හා විචාරය**, නුගේගොඩ, සරසවි ප්‍රකාශකයෝ, 1997.

එස්. ඩී. එන්. ධර්මරත්න, ''බෞද්ධ මුද්‍රණයේ පසුබිම සහ සියම් රාජ්‍ය අනුග්‍රහය ලද ප්‍රථම බෞද්ධ මුද්‍රණාලය'', Colombo: *Journal of the Royal Asiatic Society of Sri Lanka*, Vol.xlvii, 2003, 254ff.

ඒ. වී. සුරවීර, ''නූතන සාහිත්‍යාවලියේ අවසානය හා නූතන යුගයේ ආරම්භය'', **ශ්‍රී සුමංගල**, සංස්ඃ කඩිහිංගල සෝරත හිමි, කොළඹඃ විද්‍යෝදය විශ්වවිද්‍යාලය, 1962.

ඒ. වී සුරවීර , සිංහල සාහිත්‍ය සම්ප්‍රදාය, කුරුළු පොත් , රාජගිරිය , 1998

කලුකොඳයාවේ ප්‍රඥාශේඛර හිමි, **සිංහල පුවත්පත් සඟරා ඉතිහාසය**, 1832-1887, 1 කා., කොළඹඃ එම්. ඩී. ගුණසේන සහ සමාගම, 1965.

කුසුමා කරුණාරත්න, ''නූතන සාහිත්‍ය යුගය'', **ලංකා ඉතිහාසයේ බ්‍රිතාන්‍ය යුගය**, සංස්. ජී. පී. වී. සෝමරත්න, දෙහිවලඃ තිසර ප්‍රකාශකයෝ 1991.

කේ.එන්. ඕ. ධර්මදාස, ''යටත් විජිත යුගයේ ඇති වූ හෙළ බොදු පුනරුදය'', **අපේ සංස්කෘතික උරුමය**, කොළඹ, සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යංශය, 1995.

ජේ. ඒල **ආයාසෝකමාලය,** 1893ඃ 115 පද්‍යය.

තිස්ස කාරියවසම්, ''සාහිත්‍ය වර්ධනයට පුවත්පත් කලාවේ දායකත්වය'',

**සාහිත්‍යය විශේෂ කලාපය**, සංස්කෘතික කටයුතු අමාත්‍යංශය, 1987.

තිස්ස කාරියවසම්, ''මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමිපාණෝ පසුබිම හා කාර්ය සාධනය'', **මොහොට්ටිවත්තේ ගුණානන්ද සමරු කලාපය**, සංස්: තිස්ස කාරියවසම් හා ප්‍රණීත් අබේසුන්දර, 1990.

ප්‍රේරා **,** අලුත් කඩේ උසාවිය ළඟදී සිදු වුණ මරණයක් හෙවත් දූලීයානු කථාව නොහොත් අවවාද මල්දම ,1895:

**මරක්කල හටනේ හෙවත් සිංහල මරක්කල කොලාහලය,**

මෙම පොත වරුස 1870 වේ දී කොළඹ ජම්බුගස් වීදියේ පදිංචි පෞලිස් ප්‍රනාන්දු විසින් ඊ. ඇස් ලවාසම්පාදනය කර අච්චුගස්වා ප්‍රසිද්ධ කරණ ලදී. කොළඹ නිල්වීදියේ නො . 37 දරණ ලක්මිණි පලග යන්ත්‍ර ශාලාවේ දී අච්චුගස්සන ලදී

ජී හේමපාල විජයවර්ධන , සිංහල ගී කාව්‍යය කෙරෙහි සංස්කෘත අලංකාර ශාස්ත්‍රයේ බලපෑම (පරි)

රෝහිණී පරණවිතාන, විසිදුනු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව, 2009

රත්නසිරි අරංගල, **නූතන සිංහල සාහිත්‍යයේ ප්‍රභවය**, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2004.

රංජිත් රුබේරු, **ලංකාවේ අධ්‍යාපනය බ්‍රිතාන්‍ය යුගය**, කොළඹ : ඇපොතකරීස් සමාගම, 1971.

**විනය පිටකය - මහා වග්ග පාලිය - ද්වීතිය භාගය ,**

ත්‍රිපිටකයේ සූත්‍ර විනය අභිධර්මය යන කොටස් තුනින් විනය කොටසෙහි විස්තර වන්නේ භික්ෂූන් වහන්සේගේ පැවිදි ජීවිතයට අවශ්‍ය වන විනය ශික්ෂා පද වේ. විශේෂයෙන් ම උපසම්පදාව ලත් භික්ෂූන් වහන්සේ අනිවාර්යෙන් ම පිළිපැදිය යුතු ශික්ෂා පද මෙන් ම වස් විසීම අවශ්‍ය උපදෙස් ද මෙහි දී විස්තර කෙරේ.

ස්වර්ණා ඉහළගම, කවිකාර මඩුව, ෆාස්ට් පබ්ලිෂින් ප්‍රයිවට් ලිමිටඩ්, කොළඹ , 2015

සී .ඊ ගොඩකුඹුර , සිංහල සාහිත්‍යය , සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව , 1999

සීලක්ඛන්ද හිමි , මිදෙල්ලව කෝරාළගේ අමුද්‍රිත කවි එකතුව

Arnold David , *Colonizing the Body*, London : Univesity of California Press, 1993.

Arnold Wright, *Twentieth Century Impressions of Ceylon,* Madras: Asian Educational Service, 1907.

Ann Blackburn, *Locations of Buddhism* (Colonization and Modernity inSri Lanka), London: The University of Chicago Press Ltd, 2010. 19

BenedictAnderson, *Imagined Communications* (Reflection on the origin and Spread of Nationalism), Biddles Ltd: Guildford and King's Lynn, 1983.

C.A. Bayly, *Empire and Information – (Intelligence gathering and social communication in India 1780 – 1870*), Cambridge University Press, 1996.

C. E. Godakumbura, *Sinhalese Literature,* Colombo: Department of Cultural Affairs, 1996.

C. N. Fernando, "Christian Missionary Enterprise in Early British Period", *University Ceylon Review*, Vol.III. (1950 ), 114.

Carl F. Kaestle and Janice A. Radway , *" A Framework for the History of Publishing and Reading in the United States , 1880 – 1940" ,*

*Edited by . Carl F. Kaestle and Janice A. Radway, A History of the Book in America, Vol. 4, Print in Motion, The expansion of publishing and reading in the United States 1880 – 1940*, The University of North Carolina Press: 2009.

Colin Clair, 'The Spread of Printing (India, Burma, Ceylon)', (ed.), Amsterdam. London: vangendt & Com, 1969.

D. J. Gogerly, *The Christiani Praòòapthi*, Colombo: ChristianVernacular Education Society, 1885.

E.R Sarathchandra, ''Language& Literatureinthe19th&20thCenturies", *History of Ceylon*, Vol.III, (Ed).K, M. de Silva, University of Ceylon, 1973.

G.. C. Mendis, *Ceylon : Today and Yesterday,* Colombo: The Associated Newspapers of Ceylon,

Gananath Obeyesekere, *Buddhism, Nationhood & Cultural Identity*, The Premodern & Precolonial Formations, Colombo: International Center for Ethnic Studies, 2004.

Harischandra de Silva, *Printing and Publishing in Ceylon,* Colombo: 1972.

Ian Haywood, *The Revolution in Popular Literature, Print, Politics and the People, 1790 – 1860*, Cambridge University Press, 2004.

John D.Rogers, *Crime, Justice &Society in Colonial Sri Lanka*, United Kingdom: Curzon. Press.

K. M. de Silva, *A History of Sri Lanka*, Delhi: Oxford University Press, 1981.

K. M. de Silva , *Social Policy and Missionary Organization in Ceylon: 1840- 1855*, Published for the Royal Commonwealth Society by Longmans, 1965.

Kithsiri Malalgoda, *Buddhism in Singhalese Society 1750-1900***,** London: University of California Press,1976.

Lally Bernadette, *Print Culture in Loughrea,1850 -1900*, England: Athenaeum Press Ltd.,Gareshead, Tyne&Wear, 2008.

Mc Murtrie, and C.Douglas . *Memorandum on the first printing in Ceylon; with a Bibliography of Ceylonese Imprints of 1737-1760,* Chicago Privately Printed, 1931.

Mendis G.C., *Coolbrook Cameran Papers*, Vol .1 1956.

Michael Roberts, "Elite Formation and Elites, 1831 – 1832" *History of Ceylon*. Vol.3, Colombo: University of Ceylon,1973, 26f.

MoriyamaMikihiro, *Sudanese Print Culture and Modernity in 19th Century West Java.,*Singapore: Singapore University Press, 2005.

Murdoch. J. and J. Nicholson, *The Classified of Catalogue of the Printed Tracts and Books in Sinhalese*, Madras. 1868.

Nira Wickramasinghe, *Sri Lanka in the Modern Age—A History of Contested Identities*, London: Hurst and Company, 2006.

Ong. Walter, J., *Orlaity and Literacy , ( The technologizing of the world*) , Methuen, London, 1982.

Olaganwatte chandasiri , Nineteenth Centurary Poetical Works and Social Institutions of Sri Lanka , Vijith Yapa Publications , 2018

Patrick Peebles, *The History of Sri Lanka,* London : Greenwood Press, 2006.

Richard Gombrich, *Therawada Buddhism* - ( A Social history from ancient

Benares to modern Colombo), Routledge & Kegan Paul Ltd, 1988.

Rogier Chartier, *The Cultural Uses of Print in Early Modern France*, Princeton: Princeton University Press, 1989.

S.G,Perera, *A History of Ceylon*, (6th ed.) (Colombo: TheAssociated News papers of Ceylon, Ltd. Lake House,1955.

S.G. Perera, *A History of Ceylon*. 6th Edition, Colombo: The Associated Newspapers of Ceylon, Ltd.,

Susan . LMizruchi, *Multicultural America - Economy and Print Culture 1865 – 1915*, The University of North Carolina Press, 2008.

Tilak Kularathna, *History of Printing& Publishing in Ceylon 1736-1912*, Sridevi Printers, 2006.

Tissa Kariyawasam, *Religious Activities and the Development of a New Poetical Tradition in Sinhalese 1852-1906*, (Ph.D.Thesis), University of London,1973.

Tissa k ariyawasam, "The Evolution of Printing and Emergence of Journalism in Sri Lanka", *The Press in Sri Lanka*,Nandana Karunanayaka (Ed). Nugegoda: Media Publisher, 1996.

Ulrike Stark, *An Empire of Books*. *(The Naval Kishore Press and the Diffusion of the Printed (World in Colonial India),* New Delhi : 2007.